# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2042/21 - 2017 ඔක්තෝබර් මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2017.10.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### වාර්තා තබාගැනීමේ නියෝග

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත**

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 64 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 75 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග, 1998 අප්‍රේල් මස 21 වන දින අංක 1024/8 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයේ* පළ කරන ලද නියෝග අවලංගු කරනු ලැබේ.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2017 ඔක්තෝබර් මස 25 වැනි දින,
කොළඹ 01.

නියෝග

1. මෙම නියෝග 2017 අංක 01 දරන "වාර්තා තබාගැනීමේ නියෝග" යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. සෑම ලියාපදිංචි තැනැත්තෙකු විසින් ම, එකතු කළ අගය මත බදු පනතේ අර්ථ නිරූපනය කර ඇති යම් බදු අය කළ හැකි සැපයුමක්, බදු අය කළ හැකි සේ සැලකෙන සැපයුමක්, ඉවත් කරන ලද සැපයුම් හෝ නිදහස් කරන ලද සැපයුම් සම්බන්ධයෙන් සහ සරල කරන ලද එකතු කළ අගය මත බදු ක්‍රමය (SVAT)සම්බන්ධයෙන් පළකරන ලද ගැසට් නිවේදනයේ දක්වා ඇති යම් අත්හිටවූ සැපයුමක් හෝ අත්හිට වූ ලෙස සලකන සැපයුමක් සම්බන්ධයෙන් වෙනත් තැනැත්තෙකුට හෝ හවුල් ව්‍යාපාරයකට අනුක්‍රමික අනුපිළිවෙලට නිකුත් කරන ලද බදු ඉන්වොයිසි හෝ අත්හිටවූ ඉන්වොයිසි හෝ වාණිජ ඉන්වොයිසි මත පදනම්ව වාර්තා තබා ඒවා පවත්වාගෙන යා යුතුය.


1A - PG3733 - 507 (2017/10)


*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

3. සෑම ලියාපදිංචි තැනැත්තෙකු විසින්ම,

(අ) මේ දක්වා;

(ආ) ගෙවිය යුතු බදු බැඳියාව නිශ්චිතව දැනගැනීම පිණිස යෙදවුම් සහ නිමැවුම් බදු වලට අදාළවන පරිදි ප්‍රමාණවත් තොරතුරු සහිතව;

(ඇ) සහකාර කොමසාරිස්වරයාට පරීක්ෂා කිරීම සඳහා හැකිවන පරිදි;

(i) විලම්භනය කරන ලද, කලින් ගෙවන ලද, නිදහස් කරන ලද, ඉවත් කරන ලද හෝ විදේශ විනිමය රහිත පදනම මත කරන ලද ආනයන

(ii) එකතු කළ අගය මත බද්ද අත්හිටුවන ලද සැපයුම්, අත්හිට වූ ලෙස සලකනු ලබන සැපයුම් හෝ අත්හිට වූ මිලදී ගැනීම්;

(iii) එකතු කළ අගය මත බදු පනතේ 22(10) වැනි වගන්තියේ දක්වා ඇති බදු අයකළ හැකි සේ සැලකෙන සැපයුම්;

(iv) විශේෂ ව්‍යාපෘති සහ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා කරන ලද බදු අයකළ හැකි සේ සැලකෙන සැපයුම් මත බදු බැර සහ අත්හිට වූ සැපයුම් මත බදු බැර සේ සැලකෙන බදු බැර;

(v) 2016 මැයි මස 02 වැනි දින හෝ එදිනට පසුව තොග හෝ සිල්ලර වෙළඳාම යටතේ එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි තැනැත්තන් විසින් 2016.11.01 දිනෙන් පසුව ඉල්ලා සිටිනු ලබන යෙදවුම් බදු;

(vi) පනතේ 21 වැනි වගන්තිය යටතේ සපයනු ලබන වාර්තා සමග ලේඛන;

සියළු සටහන් තබා, ඒවා පවත්වාගෙන යා යුතු ය.

4. ව්‍යාපාරික ස්ථාන එකකට වඩා වැඩි සංඛ්‍යාවක් ඇති ලියාපදිංචි තැනැත්තකු වන විට, එකී ව්‍යාපාරික ස්ථානයන් හි නම් සහ ලිපිනයන් බදු අය කළ හැකි ක්‍රියාකාරකම කරගෙන යන ප්‍රධාන ස්ථානයේ තබාගත යුතු ය.

5. සෑම ලියාපදිංචි තැනැත්තෙකු විසින් ම එම තැනැත්තා විසින් ගෙවිය යුතු හෝ හිමිකම් පෑ යුතු බදු ප්‍රමාණය නිශ්චය කිරීමට හැකිවන පරිදි බදු අයකළ හැකි සැපයුම් සම්බන්ධ සියලු ගනුදෙනුවල සටහන් තබා ඒවා පවත්වාගෙන යා යුතු අතර, ඒවායෙහි;

(i) බදු අයකර ඇති සෑම භාණ්ඩ හා සේවා සැපයුමක්;
(ii) සෑම ආනයනය කිරීමක් හෝ බන්ධිත ප්‍රදේශයකින් යම් භාණ්ඩ ඉවත් කිරීමක්;
(iii) ශුන්‍ය අනුප්‍රමාණ සැපයුම් ඇතුළුව ලියාපදිංචි තැනැත්තෙකු විසින් කරන ලද සියලු සැපයුම්;
(iv) අත්හිට වූ ක්‍රමය යටතේ කරන ලද සියලු සැපයුම්;
(v) බදු අයකළ හැකි සැපයුම් සේ සැලකෙන සියලු සැපයුම්;
(vi) අත්හට වූ සැපයුම් සේ සැලකෙන සියලු සැපයුම්;
(vii) ත්‍යාගයක් හෝ ණයක් ලෙස ලබා දුන් භාණ්ඩ;
(viii) යම් හානි වූ හෝ විනාශ වූ භාණ්ඩ;
(xi) බදු අයකළ හැකි සැපයුම් සිදුකරන අතරතුර අත්පත් කරගන්නා ලද හෝ නිපදවන ලද, පෞද්ගලික හෝ බදු අයකළ නොහැකි භාවිතය සඳහා යොදවනු ලැබූ භාණ්ඩ;
(x) බැරපත් සහ/හෝ හරපත් නිකුත් කිරීම/ලැබීම, බොල්ණය කපා හැරීම් සහ මීට පෙර කපා හරින ලද බොල්ණය නැවත ලැබීම් ඇතුළුව වාර්තා සඳහා කරන ලද යම් ගැලපීම්;

ඇතුළත් විය යුතුය.

6. පනතේ 64 වැනි වගන්තියෙහි සඳහන් යම් ඕනෑම ගිණුම් පොතක ඇතුළත් සටහන් සත්‍යාපනය කිරීමට අවශ්‍යවන පරිදි එකී අනෙකුත් ලිපි ලේඛන කාර්ය පත්‍රිකාවන් හි (Work Shets ) ඇතුළත් කළ යුතුය.

7. (i) නිමැවුම් බදු සහ යෙදවුම් බදු පිළිබඳ විස්තර සඳහන් කරමින් සෑම බදු අයකළ හැකි කාලසීමාවක් සම්බන්ධයෙන්ම වාර්තා පවත්වාගෙන යා යුතුය. කාර්තුමය වාර්තා සම්බන්ධයෙන් වන විට, වාර්තා මාසික පදනම මත පවත්වාගෙන යා යුතුය.

(ii) පනත යටතේ ගෙවිය යුතු බදු සම්බන්ධයෙන් තබාගත යුතු සහ පවත්වාගත යුතු ගිණුමේ ආකෘතිය ඇමිණුමෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතුය.

(iii) පනත යටතේ ඉඩදිය හැකි යෙදවුම් බදු වෙනම දක්විය යුතුය. මෙහි;

(අ) ලද භාණ්ඩ හා සේවා මත අය කරන ලද හෝ ගෙවන ලද යෙදවුම් බදු;
(ආ) බන්ධිත ප්‍රදේශයකින් ඉවත් කරන ලද භාණ්ඩ ඇතුළුව ආනයනය කරන ලද භාණ්ඩ මත යෙදවුම් බදු;
(ඇ) බොල්ණය මත නියමිත යම් සහනයක් හෝ වෙනත් ගැලපුම්;
(ඈ) සහකාර කොමසාරිස්වරයෙකු විසින් තක්සේරුවක් කරනු ලැබ ඇති අවස්ථාවක දී හැර කලින් බදු අයකළ හැකි කාලසීමාවන්ගෙන් සිදු කරන ලද අතිරේක ආගණනයන්;

(ඉ) ඉල්ලා සිටිය හැකි 2010.12.31 දිනට අවශෝෂණය නොකරන ලද යෙදවුම් බදු ප්‍රමාණය සහ පෙර බදු කාල සීමාවක සිට ඉදිරියට ගෙන එන ලද යෙදවුම් බදු අදළ වේ නම්;

(ඊ) ලියාපදිංචි තැනැත්තකු විසින් තොග හෝ සිල්ලර වෙළඳම මගින් විකිණිය යුතු භාණ්ඩ සම්බන්ධයෙන්,

(i) එම ලියාපදිංචිය 2016.05.02 දින සිට 2016.12.31 දක්වා කාල සීමාව ඇතුළත ලබා ගෙන ඇත්නම් ලියාපදිංචි වූ දිනට එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ II වන කොටසේ සඳහන් කර නොමැති බද්දට යටත් භාණ්ඩ තොග මත,

(ii) එම ලියාපදිංචිය 2016.05.02 දින හෝ එදිනට පසුව ලබා ගෙන ඇත්නම් එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ සඳහන් කර නොමැති සහ ලියාපදිංචි නොවන තැනැත්තකුගෙන් කරන ලද භාණ්ඩ මත

යෙදවුම් සේ සැලකෙන බදු බැර ඇතුළත් කළ යුතුය.

(iv) SVAT ක්‍රමය යටතේ කරන ලද මිලදී ගැනීම් සහ එම මිලදී ගැනීම් විශේෂිත කාර්යයකට හෝ විශේෂිත කාර්යයක් සේ සලකනු ලබන කාර්යයකට යෙද වූයේ ද යන්න;

(v) පනත යටතේ ගෙවිය යුතු නිමැවුම් බදු වෙනම දැක්විය යුතුය. එනම්;

(අ) බදු අයකළ හැකි සැපයුම් සේ සැලකෙන සැපයුම් ද ඇතුළුව භාණ්ඩ හෝ සේවා සැපයුම් මත ගෙවිය යුතු නිමැවුම් බදු;

(ආ) ස්වයං සැපයුම් හෝ වෙනත් ගැලපුම් මත ගෙවිය යුතු බදු;

(ඇ) සහකාර කොමසාරිස්වරයකු විසින් තක්සේරුවක් කරනු ලැබ ඇති අවස්ථාවක දී හැර කලින් බදු අයකළ හැකි කාලසීමාවකින් අඩු කරන ලද බදු ආගණනයන්;

(ඈ) අත්හිට වූ සැපයුම් මත ලද සියළුම බැර වවුචර්

8. සෑම ලියාපදිංචි තැනැත්තෙකු විසින්ම සටහන් පවත්වාගෙන යා යුතු අතර එකතු කළ අගය මත බදු වාර්තා සමග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කිරීම පිණිස පහත සඳහන් උපලේඛන පිළියෙල කර ඉදිරිපත් යුතුය.

(අ) උපලේඛන 01 (නිමැවුම් උපලේඛනය) පහත දක්වා ඇති තොරතුරු අනුව

(i) එක් එක් බදු ඉන්වොයිසි සම්බන්ධයෙන් සටහන්

(ii) වෙබ් ද්වාරයේ ඇතුළත් කඩිනම් උපදේශයන්හි දක්වා ඇති පරිදි අනුව්‍යාජ බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය (dummy TIN) සමග බදු අන්තරගත ඉන්වොයිසි සඳහා සඳහා එක් සටහනක්

(iii) වෙබ් ද්වාරයේ ඇතුළත් කඩිනම් උපදේශයන්හි දක්වා ඇති පරිදි සැපයුම් කාර්ය සඳහා වෙන් කරන ලද අනුව්‍යාජ බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය (dummy TIN) සමග එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි නොවූ රාජ්‍ය ආයතන වෙත කරන ලද සැපයුම් පිළිබඳ සටහන්

(ආ) උපලේඛන 02 (දේශීය මිලදී ගැනීම් සඳහා යෙදවුම් බදු උපලේඛනය)
(ඇ) උපලේඛන 03 (ආනයන සඳහා යෙදවුම් බදු උපලේඛනය)
(ඈ) උපලේඛන 04 (බැරපත් සහ හරපත් සඳහා උපලේඛනය)
(ඉ) යෙදවුම් සේ සැලකෙන බදු බැර සඳහා උපලේඛනය

(i) ලියාපදිංචි නොවූ තැනැත්තන්ගෙන් කරන ලද මිලදී ගැනීම් මත යෙදවුම් සේ සැලකෙන බදු සම්බන්ධයෙන් පමණක් උපලේඛණ 05 පිළියෙල කල යුතු අතර, අදාල බදු අයකල හැකි කල සීමාව සඳහා වන එකතු කල අගය මත බදු වාර්තාව සමඟ කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කලයුතු ආකෘතියද එය වේ.

(ii) ආරම්භක තොගය මත යෙදවුම් බදු සේ සැලකන බදු සම්බන්ධයෙන් ලියාපදිංචි වූ දිනට ආරම්භක තොගය පිළිබඳ උපලේඛනයක් පිළියෙල කල යුතු අතර, දේශීය ආදායම් වෙබ් ද්වාරය වෙත එක් වරක් පමණක් උඩුගත කිරීම අවශ්‍ය වේ.

(iii) ලියාපදිංචි නොවූ තැනැත්තන්ගෙන් කරන ලද මිලදී ගැනීම් සම්බන්ධයෙන්, බදු අයකල හැකි සීමාව තුල කරන ලද මිලදී ගැනීම් මත යෙදවුම් සේ සැලකෙන බද පිළිබඳ උපලේඛනයක් පිළියෙල කල යුතු අතර බදු අයකල හැකි කාල සීමාවක් සඳහා වන එකතු කල අගය මත බදු වාර්තාව සමඟ කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

(iv) ඉහත උප අයිතම(i), (ii) සහ (iii) හි සඳහන් උපලේඛන 2016 මැයි මස 02 වන දින හෝ එදිනට පසුව තොග සහ සිල්ලර වෙළඳාම සඳහා එකතු කල අගය මත ලියාපදිංචිය ලබා ගත් තැනැත්තන් සඳහා අදල වේ.

(v) උපලේඛන ඉදිරිපත් කිරීමේදී, කොමසාරිස් ජනරාල් විසින් ඊ සේවාව සඳහා දක්වා ඇති නීති ඒ ආකාරයෙන් අදල වේ.

ඉහත සඳහන් උපලේඛනයන් හි ආකෘතීන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් ද්වාරයෙහි ඇති අතර, නවීනතම උචිත උපලේඛන ආකෘතිය භාවිත කරමින් මෙම උපලේඛන පිළියෙල කළ යුතුය.

9. සෑම ලියාපදිංචි හඳුනාගත් ගැනුම්කරුවෙකු (RIP) සහ ලියාපදිංචි හඳුනාගත් සැපයුම්කරුවෙකු (RIS) විසින්ම වාර්තා පවත්වාගෙන යා යුතු අතර පහත සඳහන් උපලේඛන පිළියෙල කළ යුතුය.

(අ) SVAT 05 උපලේඛනය
(ආ) SVAT 05a උපලේඛනය
(ඇ) SVAT 05b උපලේඛනය
(ඈ) SVAT 06 උපලේඛනය
(ඉ) SVAT 07 උපලේඛනය

ඉහත සඳහන් උපලේඛනයන් හි ආකෘතීන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් ද්වාරයෙහි ඇති අතර, නවීනතම උචිත උපලේඛන ආකෘතිය භාවිත කරමින් මෙම උපලේඛන පිළියෙල කළ යුතුය.

10. සෑම ලියාපදිංචි හඳුනාගත් ගැනුම්කරුවෙකු (RIP) විසින්ම කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ගැසට් නිවේදනය අනුව සරල කරන ලද එකතු කළ අගය මත බදු ක්‍රමය යටතේ සිදු කරන ලද යම් මිලදී ගැනීමක්, ඉඩ නොදිය යුතු යම් මිලදී ගැනීමක්, අත් හිටවූ මිලදී ගැනීම් මත නිකුත් කරන ලද බැර වවුචර්, සම්බන්ධයෙන් සටහන් තබා ගත යුතුය.

11. සෑම ලියාපදිංචි හඳුනාගත් ගැනුම්කරුවෙකු (RIP) සහ ලියාපදිංචි හඳුනාගත් සැපයුම්කරුවෙකු (RIS) විසින්ම අත්හිටවූ සැපයුම් මත ලද බැර වවුචර් සම්බන්ධයෙන් සටහන් තබා ගත යුතුය.

12. ගිණුම් පොත් තබාගෙන හෝ පවත්වාගෙන යන සෑම ලියාපදිංචි තැනැත්තෙකු විසින් ම අදළ කාලසීමාව සඳහා ගෙවිය යුතු බදු හෝ ආපසු ගෙවිය යුතු වටිනාකම නිශ්චිතව දැනගැනීම පිණිස එම ගිණුම් තුලනය කළ යුතුය.

13. අඩු කළ හැකි බදු හෝ ගෙවිය යුතු බදු ගණනය කිරීම සඳහා අවශ්‍යවන පරිදි කාර්ය පත්‍රිකා (Work Sheets) එක් එක් සටහන් සම්බන්ධයෙන් වෙනම පවත්වාගෙන යා යුතුය. මෙහි;

(i) සැපයුම් මත අයකළ හැකි බදු වටිනාකම ;
(ii) බදු හැර සැපයුම් වටිනාකම ;
(iii) කරන ලද යම් නිදහස්/බදු අයකළ නොහැකි තොග හෝ සිල්ලර සැපයුම් වටිනාකම;
(iv) සැපයුම් මත අත්හිට වූ බදු වටිනාකම;
(v) සියලු ගැලපුම් හි විස්තර;
(vi) ලද සියලු බදු අයකළ හැකි සැපයුම් හි සටහන්;
(vii) කොමසාරිස් ජනරාල් වෙතින් ලබා ගත් සරල කරන ලද එකතු කළ අගය මත බදු බැර වවුචර් සහ මිලදී ගැනීම් මත නිකුත් කරන ලද බැර වවුචර්;
(viii) යෙදවුම් සේ ඉල්ලා සිටිය හැකි බදු බැර ප්‍රමාණය;

ඇතුළත් විය යුතුය.

14. සැපයුම්කරුගේ බදු ඉන්වොයිසිය හෝ අත්හිට වූ බදු ඉන්වොයිසිය හෝ ආනයනය කරන ලද භාණ්ඩ මත බදු පිළිබඳ සාක්ෂි පරීක්ෂා කිරීමෙන්, විස්තර හෝ එක් එක් ගනුදෙනුව සහ බදු ප්‍රමාණය හෝ අත්හිට වූ බදු සම්පූර්ණයෙන් ඇතුළත් වන හෝ පහසුවෙන් නිශ්චිතව හඳුනාගත හැකි වන ආකාරයෙන් සටහන් තබා ඒවා පවත්වාගෙන යා යුතුය.

15. **මුදල් පදනම මත ගිණුම් තැබීම :**

මුදල් පදනම මත ගිණුම් තැබීම සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් අවසර දෙනු ලැබූ ලියාපදිංචි තැනැත්තන් විසින් සෑම ගනුදෙනුවක් සම්බන්ධයෙන් ලද හෝ ගෙවන ලද මුදල් දැක්වීම සඳහා තම සටහන් හි තීරයක් වෙනම පවත්වාගෙන යා යුතුය.

16. **එකතු කළ අගය මත බදු පාලන ගිණුම :**

ලියාපදිංචි පුද්ගලයකු විසින් ලැබූ හෝ ලැබිය යුතු හා ගෙවූ හෝ ගෙවිය යුතු එකතු කළ අගය මත බද්ද, එකතු කළ අගය මත බදු ගිණුමේ අන්තර්ගත විය යුතුය. පහත දැක්වෙන විස්තර (අවම) මෙම ගිණුමේ දැක්විය යුතුය.

**එකතු කළ අගය මත බදු පාලන ගිණුම**

| දිනය | විස්තරය | පත්ඉරු අංකය | වටිනාකම | දිනය | විස්තරය | පත්ඉරු අංකය | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

17. ඉහත සඳහන් වාර්තා පවත්වාගෙන යාම හැරුණුකොට, පහත සඳහන් නියෝග යටතේ ලිපි ලේඛන පවත්වාගෙන යා යුතු යම් ලියාපදිංචි වී තැනැත්තෙකු විසින්;

(i) මිල පැවරුම් නියෝග සම්බන්ධයෙන් ගැසට් නිවේදනය යටතේ නිකුත් කරන ලද නියෝග,
(ii) ශ්‍රී ලංකා මුල්‍ය වාර්තාකරණ ප්‍රමිත සම්බන්ධයෙන් ගැසට් නිවේදනය යටතේ නිකුත් කරන ලද නියෝග,
(iii) මුල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් ගැසට් නිවේදනය යටතේ නිකුත් කරන ලද උපදෙස් මාලාව,
(iv) සරල කරන ලද එකතු කළ අගය මත බදු ක්‍රමය සම්බන්ධයෙන් ගැසට් නිවේදනය යටතේ නිකුත් කරන ලද උපදෙස් මාලාව,
(v) 2016.05.02 දිනට පසුව තොග සහ සිල්ලර වෙළඳාම සඳහා එකතු කළ අගය මත බදු ලියාපදිංචිය ලබා ගත් තැනැත්තන් විසින් ඉල්ලා සිටිය හැකි යෙදවුම් සේ සැලකෙන බදු බැර සම්බන්ධයෙන් ගැසට් නිවේදනය යටතේ නිකුත් කරන ලද නියෝග,
(vi) එකතු කළ අගය මත බදු පනතේ 25 (ඔ) වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝග,
(vii) එකතු කළ අගය මත බදු සඳහා පිරිවැටුම් අගය/සැපයුම් අගය, ජාතිය ගොඩනැගීමේ බද්ද, ආදායම් බදු හෝ යම් වෙනත් බදු වර්ගයක් සඳහා වන පිරිවැටුම් සමඟ සංසන්දනය

මෙම ගැසට් නිවේදනය යටතේ වාර්තා තබාගත යුතුය.

18. සියලු සටහන් දෘඪ පිටපත් හෝ මෘදු පිටපත් ආකාරයෙන්, එම සටහන් අදළ වන්නා වූ බදු අයකළ හැකි කාලපරිච්ඡේදය අවසානයේ සිට වසර පහක කාලසීමාවක් සඳහා ආරක්ෂා කර තබාගත යුතුය. එසේ වුවද, ලියාපදිංචි තැනැත්තෙකු විසින් හේතු සඳහන් කරමින් කරන ලද අයදුම් කිරීමක් මත කොමසාරිස් ජනරාල් විසින් එකී වසර පහක කාලසීමාවට පෙර එම වාර්තා විනාශ කිරීම සඳහා එම පුද්ගලයාට අවසර ලබාදීම කරනු ලැබිය හැකිය.

19. පද සම්බන්ධය අනුව අන්‍යාකාරයෙන් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම නියෝගයන් හි,
''පනත'' යන්නෙන් 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත අදහස් වේ;
''බද්ද'' යන්නෙන් පනත යටතේ ගෙවිය යුතු එකතු කළ අගය මත බදු අදහස් වේ;
''සහකාර කොමසාරිස්'' යන්නට නියෝජ්‍ය කොමසාරිස් සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ඇතුළත් වේ.

ඇමුණුම

**ගෙවිය යුතු බදු සම්බන්ධ වාර්තාවේ ආකෘති පත්‍රය**

කාල සීමාව සිට දක්වා

| | 1 මාසය | 2 මාසය | 3 මාසය |
|---|---|---|---|
| **නිමැවුම් බදු** | | | |
| සැපයුම් වටිනාකම | | | |
| **අඩු කළා :** කපා හරින ලද බොල් ණය | | | |
| **එකතු කළා :** ආපසු අයකර ගනු ලැබූ මීට පෙර කපාහරින ලද බොල්ණය | | | |
| ගලපන ලද සැපයුම් අගය | | | |
| **ගෙවිය යුතු බදු - නිමැවුම් බදු** | | | |
| **එකතු කළා :** හරපත් මත බදු | | | |
| **අඩු කළා :** බැරපත් මත බදු | | | |
| ගෙවිය යුතු ශුද්ධ බද්ද | | | |
| **යෙදවුම් බදු** | | | |
| දේශීය ඉන්වොයිසි මත අඩු කළ හැකි යෙදවුම් බදු | | | |
| ආනයන මත අඩු කළ හැකි යෙදවුම් බදු | | | |
| විලම්භනය කරන ලද ආනයන මත ලැබිය යුතු බැර වවුචර | | | |
| **එකතු කළා :** ලැබුණු හරපත් මත බදු | | | |
| **යෙදවුම් බදු :** ලැබුණු බැරපත් මත බදු | | | |
| **හිමිකම් කිව හැකි මුළු යෙදවුම් බදු** | | | |
| විලම්භනය කරන ලද ආනයන මත | | | |
| ඉදිරි ගෙවීම මත කරන ලද ආනයන මත | | | |
| දේශීය මිලදී ගැනීම මත | | | |
| **ගෙවිය යුතු ශුද්ධ බද්ද** | | | |
| **අඩු කළා :** බදු බැර | | | |
| මීට පෙර වාර්තාවලින් ඉදිරියට ගෙන එන ලද අවශෝෂණය නොකරන ලද යෙදවුම් බදු හා මීට පෙර වාර්තාවල වැඩිපුර ඉල්ලා සිටි යෙදවුම් බදු මත අඩුකරන ලද බදු ආගණනය | | | |
| ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා කරන ලද බදු අය කළ හැකි සේ සැලකෙන සැපයුම් මත බදු බර | | | |
| විශේෂ ව්‍යාපෘතීන් සඳහා කරන ලද බදු අයකළ හැකි සේ සැලකෙන සැපයුම් මත බදු බැර | | | |
| අත්හිට වූ සැපයුම් මත බදු බැර | | | |
| 2010.12.31 දිනට අවශෝෂණය නොකරන ලද යෙදවුම් බදුවලින් ඉල්ලා සිටි බදු බැර | | | |
| එකතු කළ අගය මත බදුවලට එදිරිව | | | |
| කොමසාරිස් ජනරාල් විසින් පරිපාලනය කරනු ලබන බදුවලට එදිරිව | | | |
| රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත ගෙවිය යුතු බදුවලට එදිරිව | | | |
| විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ගෙවිය යුතු බදුවලට එදිරිව | | | |
| 2016 මැයි මස 02 වන දිනට පසුව එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වූ සහ තොග හෝ සිල්ලර වෙළඳාම මගින් භාණ්ඩ විකුණන තැනැත්තකු විසින් ලියාපදිංචි නොවූ තැනැත්තෙකුගෙන් මිලදී ගන්නා භාණ්ඩ මත යෙදවුම් සේ සැලකෙන බැර | | | |

11-522

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.